# බෞද්ධ මනෝ උපදේශන ක්‍රමවේදයේ පවත්නා සුවිශේෂි බව

එම්. ඩබ්ලියු. ඩී. හර්ෂණී[1]

නූතන සමාජයන්හි බහුල වශයෙන් කතාබහට ලක්වන මාතෘකාවක් ලෙස “උපදේශනය” යන්න දැක්විය හැකිය. විද්‍යාත්මක හා තාක්ෂණික දියුණුවත් සමග අතිශය කාමභෝගී ජීවන තත්ත්වයන් පසුපස හඹායන පුද්ගලයාට දේශපාලනික, ආර්ථික, සමාජීය හා සංස්කෘතිමය වශයෙන් නොයෙක් ආකාරයේ ගැටලුකාරී තත්ත්වයන්ට මුහුණපෑමට සිදුව ඇත. එවන් අවස්ථාවන්හිදී පුද්ගලයාගේ හැසිරීම් රටාවේ යම් වෙනසක් මෙන්ම චිත්තවේගයන්හි ඇතිවෙන අපිළිවෙළ මානසික වශයෙන් පීඩාකාරී බවක් ගෙනදීමට හේතුවෙයි. එම මානසික චිත්ත පීඩාවන් අවම කොට ගෙන මානසික ගැටලු නිරාකරණය කරගැනීම සඳහා නොයෙක් ආකාරයේ බටහිර මනෝ විද්‍යාත්මක උපදේශන ක්‍රමවේද නූතනයේ දී භාවිත කරනු ලැබුව ද එහි සාර්ථක අසාර්ථක භාවය සම්බන්ධයෙන් විවිධ ගැටලු පැන නැගී තිබෙනු දැකගත හැකිය. නමුත් වසර දෙදහස් පන්සියකටත් එහා ගිය අතීතයේ දී බුදුරජාණන් වහන්සේ විසින් අනුදත් බෞද්ධ උපදේශන ක්‍රමවේදය නූතන උපදේශන ක්‍රමවේදයන්ට වඩා විධිමත් වූවකි. එම ක්‍රමවේදයේ පවත්නා සුවිශේෂී බව බව කෙතෙක්ද යන්න අවධාරණය කිරීම මෙහි මූලික පරමාර්ථය යි.

නූතන උපදේශන මනෝවිද්‍යාව තුළ දැකිය නොහැකි ආකාරයේ සුවිශේෂි උපදේශන රටාවක් බෞද්ධ උපදේශනය තුළ අන්තර්ගතව පවතියි. බෞද්ධ උපදේශනය වූකලී උපදෙස්දීමේ ක්‍රියාවලියක් පමණක්ම නොවූ අතර එහි එන මනෝ උපදේශන ක්‍රමවේදයන් පුද්ගල කුසලතාවන්, ආත්ම ශක්තිය, ආත්ම සම්මානනය ඇති කරමින් පුද්ගල ශක්තීන් ඔප්නැංවීම සඳහාත් මානසික ගැටලු නිරාකරණය සඳහාත් බෙහෙවින් හේතු වී ඇත නූතන උපදේශන මනෝවිද්‍යාව තුළ අපේක්ෂිත අරමුණු වන වැළැක්වීම (Prevention), සංවර්ධනය (Development), මග පෙන්වීම (Guidance) හා ප්‍රතිකාරය හෙවත් චිකිත්සාව (Therapy) යන සියලුම අංශ බෞද්ධ උපදේශන ක්‍රමවේදය මගින් ඉතා සාර්ථක ලෙස සාක්ෂාත් කරගැනීමට බුදුරජාණන් වහන්සේ සමත්ව ඇති බව ත්‍රිපිටකාගත තොරතුරු විමසීමේ දී පැහැදිලි වෙයි. ඒ අනුව බෞද්ධ උපදේශන ක්‍රමවේදය තුළ කිසිවිටෙකත් තාවකාලික විසඳුම් ලබා නොදීම, ඉතා කෙටි කාලයක් තුළ සාර්ථක ලෙස උපදේශන කාර්ය අවසන් කිරීම, නූතන මනෝවිද්‍යා උපදේශනයේ දී වෘත්තීයමය වශයෙන් ලැබෙන කාරුණික සංවේදීතාවට කිසිදු අයුරකින් සමාන කළ නොහැකි මහා කරුණාවකින් උපදේශනයේ යෙදීම, පුද්ගල මනෝ භාවයන්, පුද්ගල චරිත ස්වභාවයන් මනාව හඳුනාගෙන උචිත අයුරින් උපදේශනය ලබා දීම ආදිය සුවිශේෂී ලක්ෂණ වන බව පැහැදිලි වෙයි.

ප්‍රමුඛ පද: බෞද්ධ උපදේශනය, ගැටලු, මානසික පීඩා, සුවිශේෂි බව

1 පාලි හා බෞද්ධ අධ්‍යනාංය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
Email: Duleeka456@gmail.com